# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO: 548/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 29/03/2024 පැය 1215

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.03.28 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 97 | - | තඹ දඟර 01<br>යකඩ බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර.**

2024.03.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හිරණ පොලිස් වසමේ මාලමුල්ල ප්‍රදේශයේ වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය 06 මිලි ග්‍රෑම් 960 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හිරණ පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

හිරණ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2024.03.28 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඉපලෝගම පොලිස් වසමේ ඉහල කාගම ප්‍රදේශයේ වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 640 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඉපලෝගම පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වූ මරදන්කඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ඉපලෝගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. දුම්කොළ මිශ්‍ර මාවා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුර.**

2024.03.28 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තලවකැලේ පොලිස් වසමේ තලවකැලේ පුඩළුඔය මාර්ගයේ පාලම අසලදී වැටලීමක් සිදු කර දුම්කොළ මිශ්‍ර මාවා ග්‍රෑම් 27 මිලිග්‍රෑම් 650 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තලවකැලේ පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ තලවකැලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තලවකැලේ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. නීති විරෝධි දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය තංගල්ල කඳවුර.**

2024.03.28 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත බෙලිඅත්ත පොලිස් වසමේ බෙලිඅත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **නීති විරෝධී විදේශීය දුම්වැටි 402 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වැඩිදුර විමර්ශන කටයුතු සඳහා බෙලිඅත්ත පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන මොදරවාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. බෙලිඅත්ත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**